# සීගිරි කිවිඳියන්ගේ නිර්මාණ ඇසුරෙන් හෙළි වන තත්කාලීන කාන්තාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*අප්සරා සඳමාලි ආර්. පී.*[1]

සීගිරි කුරුටු ගී සිංහල පද්‍ය සාහිත්‍යයට අයත් පැරණි මූලාශ්‍රයයක් වන අයුරු හඳුනාගත හැකි ය. මෙම ගී අනුරාධපුර යුගයට අයත් ක්‍රි. ව. 8, 9 හා 10 ආදි සියවස්වල දී රචනා වූ බව පිළිගැනේ. පැරණි ශ්‍රී ලාංකේය ජන සමාජය පිළිබඳ කරුණු ගවේෂණයේ දී සීගිරි ගී වැදගත් ඓතිහාසික මූලාශ්‍රයයකි. සීගිරි ගී රචකයෝ විවිධ සමාජ ස්තර නියෝජනය කළහ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ සීගිරි කිවිඳියන්ගේ නිර්මාණ ඇසුරින් හෙළි වන තත්කාලීන කාන්තාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමයි. සීගිරි ගී ලියූවන් අතර පද්‍යකරණයේ නියැලුණු කාන්තාවන් ඇත්තේ කිහිපදෙනෙකි. සීගිරි බිතු සිතුවම්වලින් නිරූපිත කාන්තාවන් හා තදනුබද්ධ අපර මූලාශ්‍රයන් පිළිබඳ ප්‍රාමාණික පර්යේෂණයන් සිදුකර ඇතත්, සීගිරි ගී ලියූ කාන්තාවන් පිළිබඳ විධිමත් ගවේෂණයක් සිදු කර නොමැත. එම නිසා සමකාලීන සමාජයේ කාන්තාවගේ භූමිකාව ගවේෂණය කිරීමේ දී සීගිරි සිතුවම්වලට වඩා සීගිරි කිවිඳියන්ගේ නිර්මාණ කොතෙක් දුරට වැදගත් වේ ද? යන්න මාගේ පර්යේෂණ ගැටලුවයි. මේ සඳහා අනුගමනය කෙරෙන ක්‍රමවේදය වන්නේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරෙන් කරුණු විග්‍රහ කිරීමයි. ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සීගිරි ගී ද, ද්විතීයික මූලාශ්‍රය ලෙස පශ්චාත් කාලීන ප්‍රාමාණික උගතුන් විසින් සම්පාදනය කරන ලද විචාර ග්‍රන්ථ ද ඉවහල් කර ගැනේ. එහි දී සීගිරි කිවිඳියන් අතර විවිධ ප්‍රදේශ, විවිධ ස්ථර නියොජනය කළ කාන්තාවන් ද කුලය, අධ්‍යාපනය ආදිය අතින් පුරුෂයන් පවා අභිභවා ගිය කාන්තාවන් ද සිටි බව හඳුනාගත හැකි විය. පුරුෂ මූලික සමාජ ක්‍රමය තුළ වුව ද ස්ත්‍රියට හිමි විය යුතු නිසි ස්ථානය හිමි වූ බව පෙනේ. මේ අනුව 8 හා 9 සියවස් වන විට ලාංකේය කාන්තාව සමාජ, ආර්ථික, දේශපාලන හා ආගමික කටයුතුවල දී වඩාත් ස්වාධීන ව කටයුතු කළ බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ කාන්තාව, කිවිඳියෝ, භූමිකාව, ස්වාධීනත්වය, සීගිරි ගී

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.*